# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය, පළමු වසර (පුනර්)- මාර්ගගත-2021

# ආණ්ඩුක්‍රමව්‍යවස්ථා නීතිය-I

*(පැ තුනයි)*

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: 06

**<u>ඕනෑම</u>** ප්‍රශ්න **<u>තුනකට (03)</u> පමණක්** පිළිතුරු සපයන්න.
(විභාග අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.)

---

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ව්‍යවස්ථානුකූලවාදයේ සහ නීතියේ ආධිපත්‍යයේ මූලධර්ම පැතිකඩ ගණනාවකින් එකිනෙක හා බැඳී තිබේ. මෙම සංකල්පයන් ද්විත්වයම මූලික වශයෙන්, රාජ්‍යයක යහපාලනය ඉහළ නැංවීමට කටයුතු කරන අතරෙහි බලය සීමා කිරීම අරමුණු කරයි. මහජනතාව, ස්වකීය පාලකයන්ගේ ක්‍රියාකාරකම් මැන බැලීම පිණිස, මෙම සංකල්පයන් මිනුම් දඬු වශයෙන් භාවිතා කරති.

   ඉහත ප්‍රකාශය සමග ඔබ එක්ඟ වන්නේහි ද ? ඉහත ප්‍රකාශය, ශ්‍රී ලංකාව තුළ මෑත කාලීනව ඇති වූ ආණ්ඩුක්‍රමව්‍යවස්ථාමය ගැටළු ඇසුරින් සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීරණ නීතිය ඇසුරින් තහවුරු කළ යුතුය.

   (ලකුණු 100)

2. කයිටී ජනරජයේ පාර්ලිමේන්තුවේ න්‍යායපත්‍රය තුළ විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත ඇතුළත් කර තිබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන ව්‍යවස්ථාවෙහි සඳහන් වන්නේ, ජෛන ආගමික පරිචයන් සුරක්ෂණය කර පෝෂණය කිරීම කයිටී රාජ්‍යයේ යුතුකම විය යුතු බවයි. ජෛන ආගම කයිටි රාජ්‍යයේ ජීවත් වන බහුතර ජනතාවක් අදහන ආගම වේ. යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය කෙටුම්පතෙහි විශේෂ වගන්තියක් මගින් ජෛන ආගම කයිටී ජනරජයේ රාජ්‍ය ආගම බවට පත් කිරීම යෝජනා කරයි. රාජ්‍යයේ සුළුතර ආගමික කණ්ඩායමක් නියෝජනය කරන පාර්ලිමේන්තුවේ විපක්ෂනායකවරයා වන බ්‍රාවෝ මහතා මාධ්‍යය සාකච්ඡාවකදී ප්‍රකාශකර සිටින්නේ මෙම වගන්තිය ඔවුන්ගේ ප්‍රජාවට තර්ජනයක් විය හැකි අතර එමගින් කයිටී හී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ව්‍යුහය උල්ලංඝනය කරනු ලැබිය හැකි බවයි.

මේ අතරතුර, විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සහාය පළ කරන, ආණ්ඩු පක්ෂයේ සාමාජිකයකු වන කොල්වින්, බ්‍රාවෝගේ අනන්‍යතාවය සහ ආගමික මූලය පහත්කරමින් අපහාසාත්මක ප්‍රකාශනයන් කිහිපයක් සිදුකරන ලදී. ඔහු විසින් මෙම ප්‍රකාශයන් සිදුකරනු ලැබූයේ ඔහු පාර්ලිමේන්තුවේ විවාදයකට සහභාගී වෙමින් සිටි අවස්ථාවක දීය. මෙම අපහාසාත්මක ප්‍රකාශයක් විවාදයට අදාළ ඒවා නොවීය.

කයිටී හී ආණ්ඩුක්‍රමව්‍යවස්ථාමය පාලන ක්‍රමය ශ්‍රී ලංකාවට සමාන බව උපකල්පනය කරන්න. ඉහත ප්‍රකාශය, අයිතිවාසිකම්, ජනතා පරමාධිපත්‍යය සහ පාර්ලිමේන්තුවට අදාල ආණ්ඩුක්‍රමව්‍යවස්ථාමය ප්‍රතිපාදන ඇසුරෙන් සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර අදාළ නෛතික සහ නඩු තීරණ අධිකාරීන් ඇසුරින් තහවුරු කරන්න.

(ලකුණු 100)

3. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සාපේක්ෂව ගත්කල, ශ්‍රී ලංකාවේ ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් ද්විත්වයම, පාර්ලිමේන්තුවට සහ විධායකයට, අධිකරණයේ සංයුතියට හා අධිකරණමය ක්‍රියාවන් වලට අදාල කාරණාවලට, අධිකරණ ස්වාධීනතාවය දුර්වල කරන ආකාරයෙන් මැදිහත් වීමට අවකාශය සලසා දී තිබේ.

ඉහත ප්‍රකාශය සමග ඔබ එකඟවන්නෙහිද? අදාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදනයන්, නඩු තීරණ අධිකාරීන් හා අවස්ථාපිත උදාහරණ ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 100)

4. ගායිස් රාජ්‍යයේ ජනාධිපතිවරයා වන මහල්, රට කලාපීය පාපන්දු ශූරතාවය දිනාගැනීමෙන් අනතුරුව, ගායිස් හී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මරණීය දණ්ඩනය ලබාදී තිබූ සිරකරුවන් දෙදෙනකුට ජනාධිපති සමාව ප්‍රදානය කරයි. එක් සිරකරුවෙකු ජනාධිපති මහල්, නායකත්වය දරන දේශපාලන පක්ෂයේ සාමාජිකයෙකු වන හිටපු කැබිනට් අමාත්‍යවරයකුගේ ඥාතියෙකු ලෙස හඳුනාගෙන තිබේ. එබැවින් මෙම සමාව පක්ෂග්‍රාහී බැඳියාවන්ගෙන් උත්තේජනය ලද බවට චෝදනා කරමින් බොහෝ විවේචනයන්ට බඳුන් විය. මීට ප්‍රතිචාර ලෙස ජනාධිපති මහල්, ඔහු සමාව දීමට තීරණය කළේ හුදෙක් ඔවුන් ස්වකීය අපරාධයන් පිළිබඳව පසුතැවීම නම් කාරණය සලකාබලා බවට ප්‍රකාශ කරමින්, මාධ්‍යය නිවේදනයක් නිකුත් කරයි.

මහල් තවදුරටත් ප්‍රකාශකළේ, සමාව ප්‍රදානය කිරීමට පෙර ඔහු ගායිස් හී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්දේශ කරන ක්‍රියාපටිපාටිය අනුගමනය කළ බවයි. කෙසේ වුවද, එම සමාවදීමට විරුද්ධව නඩුව විභාගකළ විනිසුරුවරයා වාර්තාවක් ඉදිරිපත්කර තිබූබව අනාවරණය විය. එසේ වුවද, අධිකරණ අමාත්‍යවරයා ප්‍රකාශකර සිටින්නේ, නඩුව විභාගකළ විනිසුරුගේ වාර්තාව සහ නීතිපතිවරයාගේ උපදෙස් යන දෙකම සලකාබලා ඔහු විසින් සමාව දීම පිණිස ජනාධිපතිවරයාට නිර්දේශයක් ඉදිරිපත්කළ බවයි. පසුව ජනාධිපතිවරයාගේ ක්‍රියාවට එරෙහිව සිවිල් සංවිධානයක් විසින් ගායිස් හී ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ දී නෛතික ක්‍රියාමාර්ග ගනු ලබයි.

මෙම කාරණය සම්බන්ධයෙන් අදාළ සිවිල් සංවිධානය ඔබගේ උපදෙස් පතනබව උපකල්පනය කරන්න. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සමාව දීම පිණිස ඇති විධායක බලයට විශේෂ අවධානය යොමු කරමින්, විශ්ලේෂණාත්මක වාර්තාවක් ලියන්න. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගායිස් හී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සමාන බව උපකල්පනය කරන්න. ආණ්ඩුක්‍රමව්‍යවස්ථාමය ප්‍රතිපාදන, නඩු තීරණ නීතිය සහ අවස්ථාපිත උදාහරණ ඇසුරින් ඔබගේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 100)

5. සිලෝනිකා හි රාජ්‍ය විශ්වවිද්‍යාලයක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු වන රාජා, ඔහුගේ වසර හතරක ප්‍රායෝගික පර්යේෂණය මත පදනම්ව "සිලෝනිකා හී ඓතිහාසික කෘෂිකාර්මික පරිචයන්" නමින් කෘතියක් රචනාකර ඇත. මෙම කෘතිය සිද්ධි අධ්‍යනයන් මත පදනම්වෙමින් කෘෂිකර්මාන්තයේ දී කාබනික පොහොර භාවිතයෙහි වාසි සහ අවාසි සාකච්ඡා කරයි. මෙම කෘතිය2021 ඔක්තෝබර් 21 වන දින විශ්වවිද්‍යාලයීය පරිශ්‍රයේදී එළිදැක්වීමට කටයුතු යොදාගෙන තිබිණි. ඒ අතරතුර, සිලෝනිකා හී ආණ්ඩුව, එහි 2030 සංවර්ධන සැලැස්මේ අංගයක් වශයෙන්, රටේ කාබනික වගාව ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගනිමින් රසායනික පොහොර භාවිතය තහනම් කිරීමට සහ මෙගාලන්ත රාජ්‍යයෙන් කාබනික පොහොර ආනයනය කිරීමට තීරණය කරයි.

දින කිහිපයකට පසුව, රටේ පවත්නා වසංගත තත්වය හේතුවෙන් විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ කෘතිය එළිදැක්වීම නතර කරන ලෙස ඉල්ලමින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින්, රාජා ලිපියක් ලබයි. එසේ වුවද, වෙනත් ස්ථානයකදී කෘතිය එළිදැක්වීමට රාජා

සමත්විය. එළිදැක්වීමෙන් සතියකට පසුව, එම කෘතිය හරහා කාබනික වගාව පිළිබඳ මිත්‍යා සහ පිළිගත නොහැකි කරුණු ඉදිරිපත් කරන බවත්, ඒ නිසා රට තුළ කාබනික වගාව ප්‍රවර්ධනයටය කිරීමට ආණ්ඩුව ගෙනයන ප්‍රයත්නය යටපත් කරන බවත් දක්වමින් සිලෝනිකා හී මෙම කෘතිය බෙදාහැරීම හා විකිණීම, රජය විසින් තහනම් කර ඇති බව, ඔහුට දැනගන්නට ලැබිණි. මේ අතරතුර, රටේ ගොවීහු, රසායනික පොහොර තහනම් කිරීමට රජය ගත් තීරණයට එරෙහිව විරෝධයපෑම ආරම්භ කරති. සිලෝනිකා හි දුෂ්කර ප්‍රදේශයක ගොවියකු වන සුනිල් ඔහුගේ ගමේ සෙසු ගොවිසගයන් සමග විරෝධතාවයක් සංවිධානයකර තිබේ. කෙසේ වුවද, විරෝධතාවය පැවැත්වීමට නියමිත දිනයේදී, විරෝධතාවය සෞඛ්‍ය අමාත්‍යාංශය නිකුත්කර ඇති කොවිඩ්-19 සෞඛ්‍ය මාර්ගෝපදේශයන් උල්ලංඝනය කරන බව සඳහන් කරමින් පොලිසිය එම විරෝධතාවය නැවැත්වීමට අණ කළේය. සුනිල් විසින් සංවිධානය කරන ලද විරෝධතාවයෙ සිට නැවත නිවස බලා යමින් සිටි, කමල් හා සීතා ව පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ. ඔවුන්ව භාරයට ගනු ලැබුවේය ඇයිදැයි කිසිදු හේතුවක් පොලිසිය ලබාදී නැත. පසුව නිසි පරීක්ෂණයක් (PCR) රහිතවම ඔවුනට ආණ්ඩුවේ නිරෝධායන මධ්‍යස්ථානයක රැඳීසිටීමට බල කෙරෙන ලදී.

රාජා සුනිල් කමල් හා සීතා සිතන්නේ ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවයි. ඔවුන් ඔබගේ උපදෙස් පතයි. ඔවුනට උපදෙස් දෙන්න. සිලෝනිකා හී නීති පද්ධතිය ශ්‍රී ලංකාවට සමාන බව උපකල්පනය කරන්න. ඔබගේ පිළිතුර ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීරණ ඇසුරින් තහවුරු කරන්න.

(ලකුණු 100)

6. පහත දැක්වෙන දෑ අතුරින් ඕනෑම දෙකකට (02) පිළිතුරු සපයන්න.

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය මූලධර්ම හා නූතන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා නීතියෙන් පිළිගත් ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් ඇසුරින්, ශ්‍රී ලංකාවේ වර්තමාන සමානුපාතික නියෝජන ක්‍රමයේ ඇති බාධා සහ දුර්වලතාවිශ්ලේෂණය කරන්න.

(ලකුණු 50)

(ආ) ඇතැම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සංශෝධනයන් හරහා ශ්‍රී ලංකාවට හඳුන්වාදුන් ස්වාධීන කොමිෂන් සභාවන්හි වැදගත්කම පිළිබඳව නිර්දේශ ලබාදීම පිණිස විශේෂ කමිටුවකට ඔබව පත් කර ඇති බව උපකල්පනය කරන්න. ඔබ කැමති කොමිසමක් තෝරාගෙන එහි බලතල, කාර්ය සහ වගකීම් පිළිබඳ විශ්ලේෂණාත්මක වාර්තාවක් ලියන්න.

(ලකුණු 50)

(ඇ) ශ්‍රී ලංකාවේ කැබිනට් අමාත්‍ය අමාත්‍යවරයෙකු ගේ භූමිකාව, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිවරයාට ලබා දුන් පුළුල් බලතල මගින් සඟවා ඇත. ඔබ එකඟ වන්නේහිද? විස්තර කරන්න.

(ලකුණු 50)

(ඈ) ඓතිහාසික වශයෙන් ඉන් අපේක්ෂිත ප්‍රතිඵල ලබාදීමට අසමත් වුව ද, රටේ ආණ්ඩුක්‍රමව්‍යවස්ථා ප්‍රතිසංස්කරණකරුවන් විසින් , 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වාදුන් විධායක කාරකසභා ක්‍රමය ඉහළින් පිළිගැනීමට ලක්කර තිබේ. සාකච්ඡා කරන්න.

(ලකුණු 50)

********************